රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 19/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1988 ජුනි මස 28 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## විශ්‍රාම ගැනීමේදී හඳුනුම්පත් සහ පවුලේ විස්තර

වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් සහ වැන්දඹු පුරුෂ හා අනන්දරු විශ්‍රාම වැටුප් ගෙවීම පහසු කිරීම සහ එම ලේඛණ යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා, 1987 නොවැම්බර් මස 17 වැනි දින හෝ ඊට පසු දිනක හෝ රජයේ සේවයෙන් විශ්‍රාම ගන්නා රජයේ නිලධාරියෙකු ලවා මෙහි ඇමුණුම් 1 හි දක්වා ඇති ආකෘති පත්‍රය සම්පූර්ණ කරවා, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් එය නිවැරදි බවට සහතික කිරීමෙන් පසු විශ්‍රාම වැටුප් අයදුම්පත සමග ඉදිරිපත් කළයුතුය. මෙම ආකෘති පත්‍රයේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවේ ගොනුකර තැබිය යුතුය.

2. (අ) විශ්‍රාම වැටුප් අයදුම්පත පිළියෙල කරනු ලබන පොදු 55 දරණ ආකෘති පත්‍රයේ 34 වැනි ඡේදයේ 4 (අ) වැනි අනු ඡේදයේ වරහන් තුළ දැක්වෙන "බැංකුවක් මඟින් ගෙවීම ලබාගන්නේ නම් හෝ" යන වචන කරුණාකර ඉවත් කරන්න.

සහ

(ආ) විශ්‍රාම යන සෑම නිලධාරියෙකු වෙනුවෙන්ම (භාණ්ඩාගාර 148 ආකෘති පත්‍රය සහ භාණ්ඩාගාර 147 ආකෘති පත්‍රය) හඳුනුම්පත් එවිය යුතු බව සටහන් කරගන්න.

Siriwardhana

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන.
ලේකම්.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.